## 8 වැනි පරිශිෂ්ටය
## (XII – 14 :4)
## (XV – 4:12)
## සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබන නිලධරයන් අත්සන් කළ යුතු ගිවිසුමේ ආකෘතිය

(ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමතිය නොමැතිව මෙම ආකෘතිය සංශෝධනය නොකළ යුතු ය)

### ගිවිසුම

(මෙහි මින් මතු ආණ්ඩුව යනුවෙන් සමහර තැනක සඳහන් කෙරෙන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව එක් පක්ෂයකට ද (මෙහි මින් මතු එකී අභ්‍යාසලාභියා යනුවෙන් සඳහන් කෙරෙන) -------------------------------- නියුක්ත (1) --------------------- නමැත්තා අනෙක් පක්ෂයට ද බැඳී එම දෙපක්ෂය විසින් වර්ෂ දෙදහස් ------------------------------ ක් වූ --------------- මස ----------------- වැනිදා වන මෙදින ලියා අත්සන් කරනු ලබන ගිවිසුම් පත්‍රයයි. (මෙහි මින් මතු ප්‍රදායක ඒජන්සිය යනුවෙන් සමහර තැනක සඳහන් කෙරෙන) ----------------- විසින් එකී අභ්‍යාසලාභියාට ------------------------------ හැදෑරීමට හැකිවනු පිණිස (මෙහි මින් මතු නියමිත කාල සීමාව යනුවෙන් සඳහන් කෙරෙන) ---------------------- සිට ---------------------- දක්වා කාලයක් පවත්නා ශිෂ්‍යත්වයක් ප්‍රදානය කර ඇති හෙයින් ද, එසේම එකී අභ්‍යාසලාභියාට එම අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව හැදෑරීමට හැකිවන පරිදි මෙහි පහත දැක්වෙන නියමයන්ට හා කොන්දේසිවලට අනුව ඔහුට (2) ---------------------- සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු දීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව එකඟ වී ඇති හෙයින් ද,

(1) අභ්‍යාසලාභියාගේ සම්පූර්ණ නම

(2) නිවාඩු කාලය

එසේම එකී නියමයන්ට හා කොන්දේසිවලට අනුව එම ශිෂ්‍යත්වය බාර ගැනීමටත්, එම කාර්යය සඳහා (3)-------------------------- ට යාමටත් එකී අභ්‍යාසලාභියා එකඟ වී ඇති හෙයින් ද,

(3) රට

දැන් මේ ලියා අත්සන් කරන ගිවිසුමේ වග හැටි මෙසේ ය;

(1) ආණ්ඩුව නියම කළ විට එකී අභ්‍යාසලාභියා (3) --------------------- ට ගොස් එහිදී, ප්‍රදායක ඒජන්සිය සහ/හෝ ------------------ විසින් ඔහු වෙනුවෙන් පිළියෙළ කොට ඇති අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව නියමිත කාල සීමාව ඇතුළත දී අනලස්ව හැදෑරිය යුතු ය.

(2) එකී අභ්‍යාසලාභියා (3) ------------------- ට පැමිණි පසු ප්‍රදායක ඒජන්සියේ පරිපාලන ප්‍රධානියා වෙත ගොස් තමා පැමිණි බව වාර්තා කොට, ස්වකීය කටයුතු සම්බන්ධයෙන් එකී ප්‍රදායක ඒජන්සිය සහ/හෝ ----------------- විසින් නියම කරනු ලබන පුද්ගලයාගෙන් හෝ පුද්ගලයන්ගෙන් වරින්වර ලැබෙන සියලුම උපදෙස් පිළිපැදිය යුතු ය.

(3) එකී අභ්‍යාසලාභියා (3) -------------------- හි සිටින කාලය ඇතුළත ඔහු විසින් එකී අධ්‍යයන හෝ අභ්‍යාස පාඨමාලාවට අදාළ විය හැකි කවර කාර්යයක් වුවද ඉටු කළ යුතු ය. එසේම තමාගේ වැඩ කටයුතු, පදිංචිය සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් ------------------ න් ලැබෙන සියලුම උපදෙස් ද නොපිරිහෙලා විධි වූ පරිදි පිළිපැදිය යුතු ය.

(4) එකී අභ්‍යාසලාභියා ---------------- ගේ අනුමතිය කල් ඇතිව ලියවිල්ලකින් ලබා නොගෙන, මෙහිලා සඳහන් කර ඇති සුදුසුකම් සහ/හෝ පුහුණුව හැර වෙනත් සුදුසුකම් සහ/හෝ පුහුණුවක් ලබා ගැනීමවත්, එබන්දක් ලබාගැනීම සඳහා වෙනත් අධ්‍යයන හෝ අභ්‍යාස පාඨමාලාවක් හැදෑරීමවත් නියමිත කාල සීමාව ඇතුළත නොකළ යුතු ය.

(5) ඉදින් පුහුණුව ලබන කාලය තුළ යම් අවස්ථාවක දී තමාට සලස්වා ඇති පහසුකම්වලින් එක එල්ලේ ලැබෙන ප්‍රතිඵලයක් වශයෙන් එකී අභ්‍යාසලාභියා යම්කිසි අලුත් ක්‍රියාවලියක්, ශිල්පීය ක්‍රියා පද්ධතියක් හෝ සූත්‍රයක් සොයා ගතහොත් හෝ ඒ පිළිබඳ අත්හදා බැලීමක් කළහොත් හෝ ඔහු විසින් වහාම එම ක්‍රියාවලිය, ශිල්පීය ක්‍රියා පද්ධතිය හෝ සූත්‍රය හෙළිදරව් කරමින් ඒ පිළිබඳ සියලුම විස්තර ලියාපදිංචි තැපෑලෙන් (4)------------------- වෙත එවිය යුතු ය. එසේම ------------ විසින් එය අනාවරණය කරනු ලබන තුරුම ඔහු එම කරුණ සම්පූර්ණයෙන්ම රහසිගතව තබාගත යුතු ය.

(4) ආයතන ප්‍රධානියාගේ පදවි නාමය

(6) එකී අභ්‍යාසලාභියා විසින් එකී අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාවේ කාල සීමාව ඇතුළත කරනු ලබන වැඩක් හෝ ඉටු කරනු ලබන සේවාවක් හෝ වෙනුවෙන් ස්වකීය අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව භාරව සිටින බලධරයන්ගෙන් කිසිම ගාස්තුවක් හෝ මුදලක් ඉල්ලා සිටීම, බාර ගැනීම හෝ ලබා ගැනීම නොකළ යුතු ය. ඉහත කී පරිදි එබඳු යම්කිසි ගාස්තුවක් හෝ මුදලක් හෝ ඔහුට යම් අවස්ථාවක දී ගෙවනු ලැබුවහොත් (4) --------- නියම කරන ආකාරයට ඔහු එම මුදල් සම්බන්ධයෙන් සුදුස්සක් කළ යුතු ය.

(7) එකී අභ්‍යාසලාභියා තමා (3) ----------- හි නැවතී සිටින කාලය තුළ ස්වකීය අධ්‍යයන හා අභ්‍යාස පිළිබඳ වාර වාර්තා ප්‍රදායක ඒජන්සියේ පරිපාලන ප්‍රධානියා ලවා සහතික කරවාගෙන (4) --------------- වෙත එවිය යුතු ය.

(8)
එසේම ඉදින්,

(අ) එකී අභ්‍යාසලාභියාගේ වැඩ සහ/හෝ හැසිරීම සතුටුදායක නොවුවහොත්,

(ආ) රෝගාතුර වීම හෝ සෞඛ්‍යයෙන් පිරිහීම නිසා තවදුරටත් පුහුණුව ලබන්නට එකී අභ්‍යාසලාභියා අයෝග්‍ය වුවහොත් හෝ නුසුදුසු වුවහොත්,

(ඇ) එකී අභ්‍යාසලාභියා මෙහිලා නියම කර ඇති නියමයන් හා කොන්දේසි අනුව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත්,

(ඈ) එකී අභ්‍යාසලාභියා තමන් ලබන අධ්‍යයනය සම්බන්ධයෙන් (4) ------------- වෙත වාර වාර්තා එවීම පැහැර හැරියහොත්,

(ඉ) එකී අභ්‍යාසලාභියා -------------------- ආණ්ඩුව හෝ එරට ජනයා හෝ එරට සිරිත් විරිත් හෝ විවේචනය කළහොත් හෝ ඒ පිළිබඳ අයෝග්‍ය ප්‍රකාශයක් කළහොත්,

එවිට මෙම ගිවිසුම අවලංගු කොට එකී අභ්‍යාසලාභියා කවර අවස්ථාවක දී වුවද ආපසු කැඳවීමට (4) ------------------------ ට නිදහස ඇත්තේ ය.

යම් හෙයකින්, කිසියම් ප්‍රබල හේතුවක් නිසා ප්‍රදායක ඒජන්සිය විසින් එකී අභ්‍යාසලාභියාගේ ගමන් ආධාර මුදලෙන් ආපසු ගමනට අයත් කොටස් අහිමි කරන්නට යෙදුනහොත්, ශ්‍රී ලංකාවට ආපසු ඊමේ ගමන් වියදම් එකී අභ්‍යාසලාභියා විසින්ම දැරිය යුතු ය.

(9) (3) -------------------- හි එම අධ්‍යයනය හා පුහුණුව අවසන් කිරීමෙන් පසු තමාට (4) --------------------- ගෙන් වෙනත් නියමයක් නොලැබුණහොත් එකී අභ්‍යාසලාභියා වහාම ශ්‍රී ලංකාවට පෙරළා අවුත් ආණ්ඩුව යටතේ තම රාජකාරී නැවත බාරගත යුතු ය. එසේ රාජකාරී නැවත බාරගත් දින සිට අවුරුදු (5) -------------------- ට නොඅඩු කාලයක් ඒ නියමය පරිදි එකී කාලය ගතවන තුරු ආණ්ඩුව යටතේ සේවය කළ යුතු ය.

(5) අනිවාර්ය සේවා කාලය

(10) ----------------------------- පිළිබඳ එම අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව හදාරන අතරතුර දී එකී අභ්‍යාසලාභියා, තම දෙපාර්තමේන්තුවේ නිලධරයන්ට සාමාන්‍යයෙන් හා විශේෂයෙන් ප්‍රයෝජනවත් විය හැකි වන කරුණු සම්බන්ධයෙන් ලබා ගත් දැනුම් වෙසෙස ඇතුළත් සවිස්තර වාර්තාවක් තමා වැඩ බාර ගෙන මාස ------------------ ක් ඇතුළත දී ස්වකීය දෙපාර්තමේන්තු නිලධරයන්ගේ දැනගැනීම සඳහා (4)-------------- --------- වෙත ඉදිරිපත් කළ යුතු ය.

(11) --------------------------------- හි සිටියදී රෝගාතුර වීම හේතුකොට ගෙන තම පුහුණු කාල සීමාව අවසන් කරන ලෙස හෝ දීර්ඝ කරන ලෙස ඉල්ලමින් එකී අභ්‍යාසලාභියා විසින් (4) --------------------------- වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන්නේ නම් තමා රෝගාතුර වී සිටින බව සනාථ කරනු පිණිස (6) ------------------------- විසින් අනුමත කරනු ලබන වෛද්‍ය නිලධරයෙකුගෙන් ලබාගත් සහතිකයක් ද ඒ ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

(6) අධ්‍යයනය ලබන රටෙහි සිටින ශ්‍රී ලංකා නියෝජිතයා

(12) කවර කරුණක් නිසා හෝ අභ්‍යාසලාභියාට එම පුහුණු කාලය දීර්ඝ කිරීමක් අනුමත කරනු ලැබුවහොත් එසේ දීර්ඝ කරන ලද කාල සීමාව තුළදී ඔහු මේ ගිවිසුමේ දැක්වෙන නියමයන්ට අනුව දිගටම පුහුණුව ලබාගත යුතු ය. තවද එම දීර්ඝ කාල සීමාව ද පුහුණුවන කාල සීමාවේ කොටසක් ලෙස මුලදීම ඇතුළත් කර තිබුණක් සේ සලකා එම දීර්ඝ කළ සීමාව සම්බන්ධයෙන් ද මෙම ගිවිසුමේ විධිවිධාන සර්වප්‍රකාරයෙන්ම අදාළ වනු ඇත.

ඉහත කී පරිදි එකී කාලය දීර්ඝ කර ගැනීමට අවසර දෙන ලද්දේ නම්, නැවත රාජකාරී බාර ගැනීමෙන් පසු මෙහි මුලින් දක්වා ඇති අවුරුදු -------- ----- ක කාල සීමාවට අතිරේක වශයෙන් තවත් කාල සීමාවක් තුළ ආණ්ඩුවට සේවය කළ යුතු යැයි නියම කරනු ලැබුවහොත් එම අතිරේක කාල සීමාව ගතවන තුරු එකී අභ්‍යාසලාභියා ආණ්ඩුවට සේවය කිරීමට මෙයින් එකඟවනු ලැබේ.

(13) (අ) ඉදින් එකී අභ්‍යාසලාභියා එම පාඨමාලාවේ කාලය ගත වී අවසන් වන්නට මත්තෙන් (4) --------------------ගේ මතය පරිදි සතුටුදායක නොවන යම් යම් හේතූන් නිසා ස්වකීය ශිෂ්‍යත්වයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ තම ඉගෙනීම හා පුහුණුව අත්හැර දැමුවහොත්, මෙම ගිවිසුම යටතේ ලැබෙන සියලුම ඵල ප්‍රයෝජන ඔහුට අහිමිවූවා සේ සලකනු ලැබේ. එසේම ඔහු ඉල්ලා අස් වූ දිනය වන තෙක් එකී ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ආණ්ඩුව සහ ප්‍රදායක ඒජන්සිය විසින් ඔහු වෙනුවෙන් දරන ලද වියදම් ද සම්පූර්ණයෙන්ම ආණ්ඩුවට ආපසු ගෙවීමට ඔහු යටත් වන්නේ ය.

තවද ශ්‍රී ලංකාවට ආපසු එන ගමන සඳහා විධිවිධාන සලසා ගැනීමත්, ඒ ගමනේ යානපත්‍රවල වියදම දැරීමත් ඔහු විසින්ම කළ යුතු වන්නේ ය.

(ආ) ඉදින් එකී අභ්‍යාසලාභියාට ප්‍රදානය කරන ලද එකී අභ්‍යාස පහසුකම් ඔහුගේ වැඩ සහ/හෝ හැසිරීම සතුටුදායක නොවීමේ හේතුවෙන් ප්‍රදායක ඒජන්සිය විසින් අවලංගු කරන්නට යෙදුනහොත් හෝ, මෙහි 8 (අ), (ඇ), (ඈ) හෝ (ඉ) යන වගන්ති යටතේ එකී අභ්‍යාසලාභියා ආපසු ශ්‍රී ලංකාවට කැඳවනු ලැබුවහොත් හෝ එවිට මෙම ශිෂ්‍යත්වය සඳහා එකී අභ්‍යාසලාභියා විසින් ආපසු ගෙවිය යුතු වන්නේ ය.

(ඇ) ඉදින් එකී අභ්‍යාසලාභියා

ශ්‍රී ලංකාවට ආපසු එන ලෙස නියම කරනු ලැබූ විට එකී අභ්‍යාසලාභියා ශ්‍රී ලංකාවට ආපසු පැමිණියහොත් හෝ, තම අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව අවසන් වූ පසු නැතහොත් නියමිත කාලයට කලින් එකී අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව අවසන් කළ පසු නැවත රාජකාරී බාර ගැනීමට අපොහොසත් වුවහොත් හෝ, ආණ්ඩුව යටතේ නැවත රාජකාරී බාර ගැනීමෙන් පසු ඉහත සඳහන් පරිදි සිය රාජකාරි බාරගත් දින සිට යටත් පිරිසෙයින් අවුරුදු (5) ----------------- ක් වත් ආණ්ඩුවට සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ, ඉහත සඳහන් පරිදි සිය රාජකාරි බාර ගැනීමෙන් පසු එකී අවුරුදු ----------- ක කාල සීමාව ගතවන්නට පළමු ඔහු ආණ්ඩුව යටතේ ලබා ඇති පත්වීමෙන් ඉල්ලා අස්වුවහොත් හෝ එකී අවුරුදු (5) -------------- ක කාල සීමාව ගතවීමට පෙර අකාර්යක්ෂමතාව නිසා නොහොත් වෙනත් කිසියම් හේතුවක් නිසා ඔහු සේවයෙන් පහකරනු ලැබුවහොත් නැතහොත් ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ, එකී අවුරුදු ------------- ක කාල සීමාව ගතවීමට පෙර ඔහුගේ වයස අවුරුදු හැට එළඹීමට කලින් විශ්‍රාම ගැනීමට මනාපය ප්‍රකාශ කළහොත් හෝ, මෙම ගිවිසුමේ වෙනත් යම් කොන්දේසියක් පිළිපැදීමට ඔහු අපොහොසත් වුවහොත් හෝ එවිට මෙම ශිෂ්‍යත්වය සඳහා එකී අභ්‍යාසලාභියා වෙනුවෙන් ආණ්ඩුවට සහ ප්‍රදායක ඒජන්සියට දැරීමට සිදු වූ වියදම් එකී අභ්‍යාසලාභියා විසින් ආණ්ඩුවට ආපසු ගෙවිය යුතු වන්නේ ය.

(14) එකී අභ්‍යාසලාභියා ස්වකීය පුහුණුව අවසන් කර හෝ නියමිත කාලයට කලින් පුහුණුව නවත්වනු ලැබ හෝ ශ්‍රී ලංකාවට ආපසු පැමිණි විට ඉහත කී අවුරුදු (5) ----------- ක කාලයක් තුළ ඔහු සේවයේ නියුක්ත කරවා ගැනීමට ආණ්ඩුව බැඳී ඇති බවක් මෙහි සඳහන් කිසිවකින් ව්‍යංගික වෙතැයි නොසැලකිය යුතු අතර එවැන්නක් අදහස් වෙතැයි තේරුම් නොගත යුතු ය.

(15) ඉහත 12 සහ 13 වගන්ති යටතේ ආණ්ඩුවට අය විය යුතු වූ ද, ගෙවිය යුතු වූ ද මුදල් ප්‍රමාණය පිළිබඳ ගිණුම් ප්‍රකාශයකැයි සැලකෙන්නා වූ ද එකී (4) ----------------- විසින් හෝ ඔහු වෙනුවට හෝ සහතික කරන ලදැයි සැලකෙන්නා වූ ද ලේඛනයක්, එය ලියා අත්සන් කළ බව හෝ එහි අඩංගු කරුණු හෝ එහි තබා ඇති අත්සන් හෝ ඔප්පු කිරීම සඳහා අතිරේක හෝ වෙනත් සාධක නොමැතිව බැලූ බැල්මට පිළිගැනෙන සාක්ෂියක් වන බවටත් මෙයින් ගිවිසගනු ලැබේ.

(16) ඉහත 8, 9 සහ 13 වගන්තිවල සඳහන් කවර කරුණක් පිළිබඳව වුවද (4) ---------------------- විසින් හෝ ඔහු වෙනුවට හෝ අත්සන් කරන ලද සහතිකයක්, එහි අඩංගු කරුණු හෝ එහි තබා ඇති අත්සන් හෝ ඔප්පු කිරීම සඳහා අතිරේක හෝ වෙනත් සාධක නොමැතිව, බැලූ බැල්මට පිළිගැනෙන සාක්ෂියක් වන බවටත් මෙයින් ගිවිසගනු ලැබේ.

(17) ------------------ යන පාඨයෙන් අදහස් කරන්නේ (4) ------------- තනතුර උසුලන්නා වූ හෝ එම තනතුරෙහි වැඩ බලන්නා වූ හෝ දැනට (4) ---------------- විසින් කරනු ලබන කාර්යයන් එවකට ඉටු කරන්නා වූ හෝ නිලධරයා ය.

(18) "වියදම්" යන පාඨයට පුහුණුවන කාල සීමාව තුළ අභ්‍යාසලාභියාට ගෙවන ලද වැටුප් සහ දීමනා ද, යානපත්‍රවල වියදම ද, පුහුණුව ලබමින් සිටියදී යම් විශේෂ දීමනාවක් ගෙවන ලද්දේ නම් ඒ දීමනා ද, වෛද්‍ය වියදම් ද එකී අභ්‍යාස පාඨමාලාව සඳහා ගාස්තු, අත්තිකාරම් හා දීමනා වශයෙන් අභ්‍යාසලාභියාට හෝ ඔහු වෙනුවෙන් හෝ යම් මුදලක් ගෙවන ලද්දේ නම් ඒ මුදල් ප්‍රමාණයන් ද ඇතුළත් වේ.

මීට සාක්ෂි වශයෙන් මේ ලියවිල්ලට සම්බන්ධ වන එකී දෙපක්ෂය විසින් වර්ෂ දෙදහස් -------------------- ක් වූ --------------- මස ----------------- වැනි දා වන මෙදින කොළඹ දී අත්සන් කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සඳහා සහ වෙනුවෙන් ක්‍රියාකරන ------------------------ පහත සඳහන් සාක්ෂිකරුවන් ඉදිරිපිට දී අත්සන් කළ බවට -

----------------------
අත්සන

**සාක්ෂිකරුවෝ**

1. අත්සන : --------------------
   නම : --------------------
   ලිපිනය : --------------------

2. අත්සන : --------------------
   නම : --------------------
   ලිපිනය : --------------------

එකී අභ්‍යාසලාභියා පහත සඳහන් සාක්ෂිකරුවන් ඉදිරිපිට දී අත්සන් කළ බවට:-

----------------------------
අභ්‍යාසලාභියාගේ අත්සන

සාක්ෂිකරුවෝ

1. අත්සන : --------------------
   නම : --------------------
   ලිපිනය : --------------------

2. අත්සන : --------------------
   නම : --------------------
   ලිපිනය : --------------------